ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

ප්‍රසිද්ධ නිවේදන අංක : HRC/Pu/i/S/23/05/23

# ප්‍රසිද්ධ නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් “සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්ඝෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය සහ නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන් පිළිබඳ නිර්දේශිත මාර්ගෝපදේශන” 2023 මැයි මස 12 වන දින එළිදක්වන ලදී. නීති විශාරදයින්, සිවිල් සංවිධාන ක්‍රියාධරයින්, නීතිය බලාත්මක කරනු ලබන නිලධාරීන්ගේ අදහස් ද විමසමින් මෙම නිර්දේශිත මාර්ගෝපදේශන වසරක පමණ කාලයකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද්දකි.

මෙම නිර්දේශිත මාර්ගෝපදේශය සම්බන්ධයෙන් වඩාත් පුළුල් ලෙස මහජන අදහස් විමසා එම කරුණු සැළකිල්ලට ලක්කරමින් අවසන් මාර්ගෝපදේශ එළිදැක්වීමට අවශ්‍ය කර ඇත. ඒ අනුව 2023 ජූනි මස 09 වන දිනට පෙර නිර්දේශිත මාර්ගෝපදේශ සම්බන්ධයෙන් පුද්ගලයින්ට සිය අදහස් හා යෝජනා ලිඛිතව සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි බසින් යොමු කිරීමට අවස්ථාව සලසා ඇත. ඒ අනුව පහත දැක්වෙන නිර්ණායක සැළකිල්ලට ගනිමින් එම යෝජනා යොමු කරන ලෙස දන්වමු.

1. සියළු යෝජනා වචන 1500 ක සීමාව තුළ විය යුතුය.
2. සිංහල බසින් යොමු කරන යෝජනා “Iskoola Pota” අකුරු වලින් ද දෙමළ යෝජනා “Latha” අකුරු වලින් ද ඉංග්‍රීසි යෝජනා “Times New Roman” අකුරු වලින් ද විය යුතුය.
3. සියළු යෝජනා ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලෙස ආමන්ත්‍රණය කර rm.director.hrcsl@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.

නිර්දේශිත මාර්ගෝපදේශ පහත දැක්වෙන අන්තර්ජාල ලිපිනයෙන් බාගත කළ හැකිය.
https://www.hrcsl.lk/hrcsl-issues-recommended-guidelines-on-dealing-with-civilian-protests/

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.05.23